# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2487/02 - 2026 මැයි මස 04 වැනි සඳුදා - 2026.05.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙහි උපලේඛනයේ (I) වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩය සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (II) වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| *(I) වැනි තීරය* | | | | *(II) වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතාංකය* | *විස්තරය* | |
| 1. | 10.05 | 1005.90 | අනෙකුත් - බඩඉරිඟු | කි.ග්‍රෑමයට රු. 50.00 |

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි සහ 5 වැනි වගන්ති යටතේ 2025 දෙසැම්බර් මස 31 දිනැති අංක 2469/12 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* දක්වා ඇති බඩඉරිඟු (සංයෝජිත වර්ගීකරණ සංකේතය 1005.90) මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, 2026 මැයි 05 වැනි දින සිට බලාත්මක වන පරිදි මෙයින් ඉවත් කරනු ලැබේ.


1A - PG 7686 — 428 (2026/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. මෙම නියමය, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව 2026 මැයි 05 දිනෙන් ආරම්භ වී 2026 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වලංගු වේ.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 මැයි මස 04 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 05 - 0021

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.